www.agaram.lk

# ROYAL COLLEGE – COLOMBO 07

## රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 08 Second Term test - July 2019

08 ශ්‍රේණිය දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි

කාලය : පැය 2
Time : 2 hours

## Drama And Theater - I

නාට්‍ය හා රංග කලාව I පත්‍රය

Name :-.............................. Class:- .................. Index number:-...................................

01 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. කිසියම් කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් රචනා කිරීමේ දී සැලකිලිමත් නොවිය යුතු කරුණ වන්නේ.

I. කතාවේ මූලික හරයට හානි නොවන ලෙස නාට්‍ය පිටපත ගොඩ නැගිය යුතුය
II. නාට්‍යයේ දී සංවාද භාවිතය හා චරිත නිරූපණය වඩා ප්‍රබල විය යුතුය
III. කතාවේ දක්නට ලැබෙන මුල මැද අග ඒ පිළිවෙලටම ඇතුලත් විය යුතුයි
IV. නාට්‍යෝචිත අවස්ථාවන් ඇතුලත් විය යුතුය

02. නාට්‍යයකට සුදුසු කතාවක දැකිය නොහැකි ලක්ෂණය වන්නේ

I. කතාවේ ඇති අපූර්ව බව
II. කිසියම් අරමුණක් පෙරදැරිව විකාශය වීම
III. කුතුහලයෙන් තොර වීම
IV. ප්‍රෙක්ෂකයාට රසයක් ලබා ගත හැකි මෙන්ම බුද්ධිගෝචර වීම

03. නාට්‍යයක් නැරඹීමෙන් අපට ජීවිතයට එකතු කර ගත නොහැකි දෙයකි

I. අපට කිසියම් රසවින්දනයක් ලැබේ
II. අපේ ජීවන ගැටළු වලට විසඳුම් ලබා ගැනීමට මඟ පෑදේ
III. අපට කිසියම් ආර්ථික වාසියක් ලැබේ
IV. කිසියම් ජීවිතාවබෝධයක් ලබා දේ

04. නාට්‍යක තේමාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ

I. නාට්‍යයක කතා වස්තුවේ තේමාව ජීවිතයට අරුත්බර අත්දැකීමක් වේ
II. නාට්‍යයක තේමාව අත්‍යවශ්‍ය කරුණක් නොවේ
III. හැම විටම හාස්‍ය සැපයීම නාට්‍යයක තේමාවේ අරමුණ විය යුතුය
IV. නාට්‍යයක තිබිය යුත්තේ එක් තේමාවක් පමණි

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

05.ඔබ නළුවරණයේදී සැලකිලිමත් නොවිය යුතු කරුණකි

I. චරිතයේ බාහිර ලක්ෂණ නිරූපණය සඳහා නළුවාගේ ගැලපීම අවශ්‍යය වේ
II. කණ්ඩායමේ සියළුම ළමුන් ලවා නාට්‍ය පෙළෙහි අවස්ථාවක් හෝ කිහිපයක් රඟ දක්ව බැලීම
III. නාට්‍ය චරිත එකිනෙක අන්තර් සබඳතාවයක් පවතින නිසා වඩා සුදුස්සන් ඒ ඒ චරිත වලට තේරීම වැදගත් ය
IV. වඩා හිතවත් විශ්වාස අයට හොඳම චරිත ලබා දීම අවශ්‍යය වේ

06.පහත සඳහන් තේමාවන් අතුරින් මාෂා හා වළහා නාට්‍යයෙන් ඉස්මතු නොවන තේමාව කුමක්ද ?

I. කුඩා ළමුන් පවා දැන ඉගෙනගත යුතු දේ බොහෝ බව
II. නපුරු ළමයි නිරතුරුවම ප්‍රතික්ෂේප වන බව
III. නරක අය යහපත් ආශ්‍රයෙන් යහපත් වන්නේ නැති බව
IV. අවිහිංසාවෙහි ඇති වැදගත් කම

07.නාට්‍යෝපකරණ අයත් වන්නේ සතර අභිනයෙන්

I. ආංගික අභිනයටය
II. වාචික අභිනයටය
III. සාත්ත්වික අභිනයටය
IV. ආහාර්ය අභිනයටය

08.ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාසයකින් බලාපොරොත්තු නොවන කරුණයි

I. ශරීරයට ප්‍රබෝධයක් ලබා ගැනීම
II. සබ කෝලය දුරු කර ගැනීම
III. යම් රංගන හැකියාවක් ලබා ගැනීම
IV. නාට්‍ය ගීත ගායනයට පිටුවහලක් වීම

අංක 09 සිට 13 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ වැරදි නම් (X) ලකුණ ද , හරි නම් (√) ලකුණ ද යොදන්න

09.නාට්‍ය පෙළ සාර්ථක වීමට රචකයාගේ පරිකල්පන ශක්තිය ප්‍රබලව බලපායි ( )

10.නළුවරණයේ දී නළුවෙකුගේ බාහිර ස්වරූපය පමණක් සලකා බැලේ ( )

11.ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ කතා පුවත් පාස්කු නාට්‍ය වලින් ඉදිරිපත් කෙරේ ( )

12.කතාවක ඇති ප්‍රබලම ලක්ෂණයකි තේමාව ( )

13.ශිථිලකරණ අභ්‍යාස වලින් මනස සැහැල්ලු කිරීම සිදු කෙරේ ( )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

14 සිට 17දක්වා ප්‍රශ්න් වලට ගැලපෙන පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න

( සාන්තුවර සෙබළානෝ , මනමේ , සිරිත් මල්දම , ආගමික කතා )

14.බෞද්ධාගමික ජාතක කතාවක් පදනම් කරගෙන .................................. නාට්‍ය රචනා කර ඇත.

15.......................................... සුගතපාල ද සිල්වා මහතා කළ කතෝලික ආගමික කතාවක් පදනම් වූ නාට්‍යයකි.

16.................................. තේමා කොට ගත් නාට්‍ය වල සංස්කෘතික හා සමාජීය වටිනාකම් බොහොමයක් ඇතුළත් වේ.

17.නාට්‍යෝචිත අවස්ථා රැගත් උපදේශාත්මක කාව්‍ය පංතියකි..........................................................

18. හඬ අභ්‍යාස සඳහා යොදා නොගන්නා ග්‍රන්ථයකි

I. බුද්ධ ගජ්ජාය
II. සකස්කඩ
III. නම් පොත
IV. සිරිත් මල්දම

19.සත්ත්ව චරිත දැකිය නොහැකි නාට්‍යයකි

I. පුංචි අපට දැන් තේරෙයි
II. වලහා සහ මාෂා
III. තරි බැනා
IV. කදා වළලු

20. ඇස් ,ඇස් බෝල, ඇස් පිහාටු ,ඇහි බැම ,නාසය ආදියෙන් අදහස් ප්‍රකාශ කිරීම අයත්

I. ආංගික අභිනයටය
II. වාචික අභිනයටය
III. සාත්ත්වික අභිනයටය
IV. ආහාර්ය අභිනයට

සෑම පිළිතුරකටම ලකුණු 2 බැගින්
( 2 X 20 = 40 )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

# II කොටස

ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. 01 ප්‍රශ්නය අනිවාර්ය වේ.

01 ). රොන් මැස්සෝ රොන් ගෙනෙති

මුර මැස්සෝ මුර කරති

සෙසු මැස්සෝ වද හදති

එකමුතු වී වැඩ කරති

I. මෙම ගීතය ඇතුළත් නාට්‍ය කුමක් ද ? (ල 03 )
II. මෙම නාට්‍ය කාගේ නිර්මාණයක් ද? (ල 03 )
III. මෙහි සඳහන් මී මැස්සන් කරනු ලබන කාර්යයන් තුනක් ලියන්න (ල 03 )
IV. මෙම නාට්‍යයෙන් කියවෙන පණිවිඩ තුනක් ( තේමාවන් ) සඳහන් කරන්න (ල 03 )
V. මෙහි රංගනයේ යෙදෙන චරිත මොනවාදැයි නම් කරන්න (ල 03 )

02 ).
I. යම් කිසි සිදුවීමක් නාට්‍යක් බවට පත් කිරීමේ දී සැලකිය යුතු කරුණු කෙටියෙන් සඳහන් කරන්න (ල04)
II. නාට්‍ය පෙළෙහි අන්තර්ගත තේමාව, සංවාද, චරිත පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න (ල06)
III. ජීවන ගැටළු විනිවිද දැකීමට නාට්‍ය අපූරු තැනකි ජීවන ගැටළු මුල් කරගත් නාට්‍ය දෙකක් නම් කර එහි රචකයන් දෙදෙනා ද නම් කරන්න (ල05)

03 ).
I. වේෂභූෂණ යන්න හඳුන්වා එය සතර අභිනයෙන් අයත් වන්නේ කුමන අභිනයටද යන්න ලියන්න (ල 05)
II. වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල 05)
III. රජ චරිතයකට සුදුසු රංග වස්ත්‍රාභරණ විස්තර කරන්න ( ල 05)

04 ).
I. ඔබ උගත් දැල්, වැදි හෝ යාතු කර්ම ගීයක් ලියන්න
II. ඔබ දන්නා නාට්‍ය ගීතයක් ලියන්න
III. නාට්‍ය ගීතයක් ගායනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද ? (ල 15 )

05 )
I. අභිනය යන්න නිර්වචනය කර ඒ පිළිබඳව ලියවී ඇති ග්‍රන්ථය කතුවරයාගේ නම සඳහන් කරන්න
II. සතර අභිනය නම් කර ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරින් එය විස්තර කරන්න
III. ආංගික අභිනයේ දී හඳුනාගන්නා අංග ,ප්‍රත්‍යාංග ,උපාංග නම් කරන්න (ල 15 )

06 ).

ඕනෑම ආගමික කතාවක් ඇසුරු කරගෙන සුදුසු පරිදි චරිත ගොඩනංවා නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න
I. සංවාද හා රංග විධාන භාවිතය (ල 10 )
II. නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම (ල 05 )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk